සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 62 S |
|---|---|---|

නම ...............................................

පුරවැසි අධ්‍යාපනය I - කොටස

කාලය පැය දෙකයි

● සැළකිය යුතුයි :-

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. පළමු පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **1 - 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

01. සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකයෙන් තොරව යහපත් ලෙස ජීවත්වීමට නම් සමාජයෙන් ................................................................... හිමි විය යුතුය.
(රැකවරණය හා මුදල්/ අධ්‍යාපනය හා ආරක්ෂාව/ රැකවරණය හා ආරක්ෂාව)

02. රටක පාලන කටයුතු හා සම්බන්ධ උත්තරීතර නීතිය වන්නේ ............................................ යි.
(අධිකරණ වාර්තා / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව/ දණ්ඩ නීති සංග්‍රහය)

03. ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර වැනි වැරදි සම්බන්ධ නීති .................................... යටතට අයත් වේ.
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය/ අපරාධ නීතිය/ සිවිල් නීතිය)

04. "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" යන්න ............................................. ආදර්ශ පාඨයයි.
(අධිකරණයේ / ශ්‍රී ලංකා පොලීසියේ / පාසලේ )

05. රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධ වගකීම .................................................. සතුව පවතී.
(ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුව / අධිකරණ පද්ධතිය / පොලිස් දෙපාර්තමේන්තුව)

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා පත්කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. (          )

07. ජාතික වශයෙන් වැදගත් වන කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී රජයට සහාය වීම ත්‍රිවිධ හමුදාවේ වගකීමකි. (          )

08. රටක ව්‍යවස්ථාදායකය යුක්තිය පසිඳලන ආයතනයයි. (          )

09. සමථ මණ්ඩලය යනු ජනතාවට ඇති ඕනෑම ආරවුලක් විසඳ ගතහැකි විකල්ප ආයතනයකි. (          )

10. ළමුන් සඳහා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම ළමා ආරක්ෂක අධිකාරියේ මෙහෙවරයි. (          )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනය වන්නේ.
1. මානව හිමිකම් කොමිෂන් සභාවයි. 2. පොලීසියයි
3. ළමා ආරක්ෂක අධිකාරියයි. 4. නීතිපති දෙපාර්තමේන්තුවයි.

12. තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා විසින් යොදාගන්නා ක්‍රම වේදයමින් කුමක් ද ?
1. අධ්‍යාපනය යි 2. ස්වභාව ධර්මය යි 3. තාක්ෂණයයි. 4. යන්ත්‍රසූත්‍ර යි

13. විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටලුවකට විසඳුම් සොයා කරනු ලබන අධ්‍යයන ක්‍රමය හඳුන්වන්නේ,
1. ගවේෂණය යනුවෙනි. 2. පර්යේෂණය යනුවෙනි.
4. නිෂ්පාදනය යනුවෙනි. 4.නිරීක්ෂණය යනුවෙනි.

14. වර්තමාන කටයුතු සඳහා සම්පත් යොදාගෙන පරිසරයට හානියක් නොවන ආකාරයට සිදුකරන සංවර්ධනය හඳුන්වන නම කුමක්ද?
1. ධරණීය සංවර්ධනයයි. 2. තිරසාර සංවර්ධනයයි.
3. පරිසර සංවර්ධනයයි. 4. ආර්ථික සංවර්ධනයයි.

15. ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුවත් කිරීමේ ඍජු දුරකථන අංකය වන්නේ මින් කුමක් ද?
1. 1919 ය. 2. 1990 ය. 3. 1929 ය. 4. 1939 ය.

- **16 සිට 20 දක්වා ප්‍රශ්න වල A කොටසට ගැළපෙන පිළිතුර B කොටසට යා කරන්න.**

| | A කොටස | B කොටස |
|---|---|---|
| 16. | පොලීසියේ කාර්යයකි. | රජය වෙනුවෙන් නඩු වලට පෙනී සිටියි. |
| 17. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යයකි. | ආරක්ෂිත ලෙස වාහන ධාවනයට යොමු කරයි. |
| 18. | නාවික හමුදාවේ ප්‍රධාන කාර්යයකි. | නීති ගරුක හා මානව හිතවාදී යහපත් පුරවැසියන් සමාජගත කිරීම. |
| 19. | රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ දැක්ම | දූපත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම. |
| 20. | නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යයකි. | සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම. |

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**


(01) i. සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් 2 ක් ලියන්න.
ii. එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමට පුද්ගලයින් පිහිටුවාගෙන ඇති සමාජ ආයතන 2 ක් ලියන්න.
iii. නීතියේ මූලාශ්‍ර 2 ක් ලියන්න.
iv. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා එක්ව කටයුතු කරන ආයතන 2 ක් නම් කරන්න.
v. අධිකරණය හා සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 2 ක් සඳහන් කරන්න.
vi. තාක්ෂණික වෙනස්වීම නිසා ඇති වන හිතකර බලපෑමක් හා අහිතකර බලපෑමක් වෙන්කර ලියා දක්වන්න.
vii. තේ නිෂ්පාදනය විවිධාංගීකරණය වීඇති ක්‍රමදෙකක් ලියන්න.
viii. පන්සල් අධ්‍යාපනයේ දී ලිවීම සඳහා භාවිතා කළ මාධ්‍යයන් 2 ක් ලියන්න. (ල. 2x 8 = 16)

(02) i. අපරාධ නීතිය යටතේ දඬුවම් කෙරෙන වැරදි 03 ක් සඳහන් කරන්නත (ල. 03)
ii. නීතිය බලාත්මක කිරීම සඳහා පවතින ආයතන 3 ක් ලියන්න. (ල. 03)
iii. අ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා කවුද? (ල. 01)
ආ. ඔහුව පත්කිරීමේ බලධාරියා වන්නේ කවුද? (ල. 01)
ඇ. නීතියේ ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)

(03) i. රූපයෙන් දැක්වෙන නිල ලාංඡනය අයත් ආයතනය නම් කරන්න. (ල. 01)
ii. එම ආයතනය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් 2 ක් ලියන්න. (ල. 04)
iii. අ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඉහළම අධිකරණ ආයතන දෙක නම් කරන්න. (ල. 02)
ආ. අධිකරණය හා සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 4 ක් ලියන්න. (ල. 04)




(04) i. තාක්ෂණය යන්න හඳුන්වන්න. (ල. 01)
ii. තාක්ෂණයත් සමග නිවාසවල සිදු වූ වෙනස්වීම් පහත රූපවලින් දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න. (ල. 04)




iii. අ. තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන අහිතකර බලපෑම් 4 ක් ලියන්න. (ල. 04)
ආ. වර්තමානයේ තාක්ෂණය යොදා ගන්නා අවස්ථා 2 ක් ලියන්න. (ල. 02)

(05) i. ඕනෑම ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුන නම් කරන්න. (ල. 03)
ii. කාර්මික අංශයේ සිදුවන දියුණුව නිසා ආර්ථිකයේ දක්නට ලැබෙන වෙනස්කම් 3 ක් ලියන්න. (ල. 03)
iii. අ. පහත රූප වලින් සංකේතවත් කෙරෙන්නේ නවීන තාක්ෂණයත් සමඟ වෙනස්වීමට භාජනය වූ කුමන ක්ෂේත්‍රයද? (ල. 01)
ආ. ඒ සඳහා බලපෑ පහත රූප නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල. 04)

................................................ ................................................ ........................................... ........................................

(06) i. සහජීවනය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ල. 02)

ii. වර්තමාන සමාජයේ සහජීවනයක අවශ්‍යතාවයට උදාහරණ 3 ක් දෙන්න. (ල. 03)

iii. අ. පුද්ගලයෙකු තුළ පැවතිය යුතු සහජීවන ගුණාංග 3 ක් ලියන්න. (ල. 03)

ආ. සහජීවන ගුනාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් ඇති වන ප්‍රතිලාභ 3 ක් ලියන්න. (ල. 03)


(07)

i. අ. මෙම නිල ලාංඡනය අයත් ව්‍යාපාරය කුමක් ද? (ල. 01)

ආ. මෙම ව්‍යාපාරයේ නිර්මාතෘ කවුරුදැයි නම් කරන්න. (ල. 01)

ඇ. මෙම ව්‍යාපාරයේ ආදර්ශ පාඨය කුමක්ද? (ල. 01)

ii. දී ඇති උපකාරක පද ආධාර කරගෙන පහත සඳහන් ප්‍රහේළිකාව පුරවන්න.




<u>හරහට</u>

1. සෑම පුද්ගලයෙකුටම බියෙන් සැකෙන් තොරව ජීවත්වීමට ඇති ඉඩකඩ මේ නමින් හැඳින්වේ.
2. අවධානම අවම කිරීම සඳහා සමුපකාර මඟින් ලබාදෙන තවත් එක් සේවාවකි.
3. යහපත්ව ජීවත්වීම යන්න අර්ථ ගැන්වේ.
4. මෙය භාවිතා කිරීම නිසා සමාජ විරෝධී ක්‍රියාවලියට පෙළඹිය හැකිය.

<u>පහළට</u>

5. සමාජ සුභ සාධනය සඳහා මිනිසුන් සිය කැමැත්තෙන් පිහිටුවාගත් සංවිධානයකි.
6. ඕනෑම බැංකුවකින් මේවා ලබාදෙයි.
7. ඕනෑම රැකියාවක නියුතු අයකු මෙය ඉටුකිරීමට බැඳී සිටී.
8. රට ආරක්ෂා කිරීමේ කාර්යයේ යෙදී සිටින්නන්ට කියන නමකි.

# පළමු වාර පරීක්ෂණය - 2019

## පුරවැසි අධ්‍යාපනය

## පිළිතුරු පත්‍රය

09 ශ්‍රේණිය

## I කොටස

| | | |
|---|---|---|
| 1 - රැකවරණය හා ආරක්ෂාව | 6 - ✓ | 11 - 1 |
| 2 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 7 - ✓ | 12 - 3 |
| 3 - අපරාධ නීතිය | 8 - ✗ | 13 - 2 |
| 4 - ශ්‍රී ලංකා පොලීසියේ | 9 - ✗ | 14 - 2 |
| 5 - ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවේ | 10 - ✓ | 15 - 3 - 1929 |

16. ආරක්ෂිත ලෙස වාහන ධාවනයට යොමු කිරීම.
17. නීති ගරුක හා මානව හිතවාදී යහපත් පුරවැසියන් සමාජගත වීම.
18. දූපත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම.
19. සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම.
20. රජය වෙනුවෙන් නඩු වලට පෙනී සිටීම.

## II කොටස

(01) i. ❖ සාමාජිකයින් අතර යහපත් සබඳතා වර්ධනය
❖ ඥාතීන්, අසල්වැසියන් සමඟ යහපත් සබඳතා පැවැත්වීම.
❖ යහපත් සමාජානු යෝජනයක් සඳහා මඟ පෙන්වීම.
❖ ආදරය, දයාව, කරුණාව වැනි ගුණාංග ප්‍රගුණ කිරීම ආදී කරුණු

ii. ළමා සමාජ, ක්‍රීඩා සමාජ, යෞවන සමිති, ආගමික සමිති, මරණාධාර සමිති

iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විවිධ අණපනත්,

iv. අධිකරණය, පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, මධ්‍යම පරිසර අධිකාරිය, කම්කරු විනිශ්චය සභාව ආදී ආයතන (පිටුව 16)

v. අධිකරණයට ගරු කිරීම, අධිකරණය කෙරෙහි විශ්වාසය තැබීම, අධිකරණ ක්‍රියාවලියට අවනත වීම, අධිකරණයට අපහාස නොකිරීම ආදී

vi. හිතකර - වැඩ පහසුවීම, කාලය ඉතිරි වීම, ඵලදායීතාවය වැඩිවීම ආදී
අහිතකර- මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම, අනවශ්‍ය පරිභෝජන රටාවන්ට හුරුවීම, මිනිසුන් යාන්ත්‍රික වීම.

vii. ක්ෂණික තේ, දියර තේ, හරිත තේ, කළු තේ, පෙට්ටිවල ඇසුරුම් කරන ලද තේ.

viii. වැලි පිල්ල, ගල් ලෑල්ල

(02) I. මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, මත් ද්‍රව්‍ය භාවිතය හා වෙළඳම

ii. අධිකරණය, පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනාගාර, ආරක්ෂක හමුදා

iii. අ. නීතිපතිතුමා ආ. ජනාධිපති
ඇ. ❖ අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පනවනු ලැබීම.
❖ නීති කඩ කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් වීම.
❖ වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස්වීම.
❖ නිරවුල්ව හා පැහැදිලිව දැක්විය යුතුවීම.
❖ සැමට සාධාරණ හා සමානව ක්‍රියාත්මක වීම.

(03) i. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ii. ❖ දේශීය හෝ විදේශීය වශයෙන් එල්ල විය හැකි තර්ජන වලින් රට ආරක්ෂා කිරීම
❖ කැරලි කෝලාහල මර්ධනයට කටයුතු කිරීම.
❖ හදිසි ආපදා වලදී රට ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම
❖ ජාතික වැදගත්කමකින් යුතු කටයුතු වලදී සහය වීම ආදී කරුණු

iii. අ. ශ්‍රේෂ්ඨාධිකරණය, අභයාචනාධිකරණය

(04) i. තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය

ii. A - ගල් ලෙනක් B - කුඩාරමක් C- කටු මැටි ගෙයක් D - සාමාන්‍ය නිවසක්

iii. අ. ❖ මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම

- ❖ අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරුවීම
- ❖ මිනිසුන් යාන්ත්‍රීකරණය වීම, සමාජය සංකීර්ණ වීම, පරිසර දූෂණය, සමාජ සම්බන්ධතා බිඳවැටීම

ආ. ගෘහ අවශ්‍යතා, සේවා අවශ්‍යතා, විවේකය හා විනෝදය සඳහා සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට, නව නිපැයුම් බිහිකිරීමට.

(05) i. නිෂ්පාදනය, බෙදා හැරීම, පරිභෝජනය

ii. ශ්‍රම විජහනය හා විශේෂීකරණය, එකලස් කිරීමේ කර්මාන්ත බිහිවීම, අධි තාක්‍ෂණික කර්මාන්ත බිහිවීම, රොබෝ තාක්‍ෂණය යොදා ගැනීම, විද්‍යුත් හා නැනෝ තාක්‍ෂණය

iii. අ. සන්නිවේදනය

ආ. A - දුරකථනය B - ෆැක්ස් යන්ත්‍රය

C - නවීන ජංගම දුරකථනය D - චන්ද්‍රිකා තාක්‍ෂණය

(06) i. එකට ජීවත් වෙමින් එකිනෙකාට උදව්කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම.

ii. විවිධත්වයෙන් යුතු සමාජයේ එකමුතුකම රැකගැනීමට සමාජ සුරක්‍ෂිත බව තහවුරු කිරීමට, අන් අයට උපකාර කිරීමට, සමානාත්මතාවය වර්ධනය කිරීමට.

iii. කණ්ඩායම් හැඟීම, සාමූහිකත්වය

(07) i. අ. සමූපකාර ව්‍යාපාරය

ආ. රොබට් ඕවන්

ඇ. එකා සැමටත් සැම එකාටත්

| <u>හරහට</u> | <u>පහළට</u> |
|---|---|
| 1 - සමාජ සුරක්ෂිතතාවය | 5 - සමූපකාරය |
| 2 - රක්‍ෂණ | 6 - ණය |
| 3 - යහජීවනය | 7 - වගකීම |
| 4 - මද්‍යසාර | 8 - රණවිරු |